www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව දෙමල රැඳවියන් "යලි පදිංචි කිරීම"

**The Sri Lankan government's "resettlement" of Tamil detainees**

**සරත් කුමාර විසිනි**
**2009 ඔක්තෝබර් 26**

ශ්‍රී ලංකා ආන්ඩුව ඉමහත් ප්‍රචාරයක් යටතේ වවුනියාව අසල රැඳවුම් කඳවුරුවල තබා ගෙන සිටින දෙමල රැඳවියන් 6,000ක් පමන "යලි පදිංචි කිරීමක්" පසුගිය බ්‍රහස්පතින්දා සිදු කලේය. මෙම අභ්‍යාසයේ සැම අංගයක් ම ගත් කල, එය වනාහි, මැයි මාසයේ දී සිදු වූ බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ පරාජයෙන් පසුව දෙමල සිවිල් වැසියන් රඳවා ගෙන සිටීම පිලිබඳව දේශීයව හා ජාත්‍යන්තරව පවත්නා විවේචන අපසරනය කිරීම පිනිස සැලසුම් කෙරුනු ප්‍රෝඩාවකි.

යුද්ධයේ අවසන් අදියරයන්හි දී යුද කලාපය තුල කොටු වූ දෙමල සිවිල් වැසියන් 250,000ක් පමන මිලිටරියේ පාලනය යටතේ පවත්නා කඳවුරු තුලට ගාල් කෙරුනි. ඔවුන්ගෙන් බහුතරය, එනම් 160,000ක් පමන වන මිනිසුන්, ගැහැනුන් හා ලමුන්, වවුනියාව අසල චෙට්ටිකුලම්හි දැවැන්ත මනින් ෆාම් කඳවුරේ රඳවා ගෙන සිටී. ඔවුන් "සරනගතයන්" ලෙස නම් කල ද මෙම සිවිල් වැසියන්ට කඳවුරුවලින් පිටතට යාම තහනම්ය. රටේ ව්‍යවස්ථාව හා නීතිය උල්ලංඝනය කරමින්, ඔවුන්ට තථ්‍ය වසයෙන් සලකන්නේ යුද සිරකරුවන් ලෙසය.

පසුගිය බ්‍රහස්පතින්දා පැවති ආන්ඩුවේ උත්සවයක දී, ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සොහොයුරකු වන ජ්‍යෙෂ්ට ජනාධිපති උපදේශක බැසිල් රාජපක්ෂ ප්‍රකාශ කලේ, "පුද්ගලයන් 41,685ක් නැවත තමුන්ගේ ගම්බිම් බලා යාම ආරම්භ" කල බවත් ඔවුන් "දින කිහිපයක් ඇතුලත ක්‍රමයෙන් ගම්බිම්වලට යන" බවත්ය. පුනරුත්ථාපන ඇමති රිෂාඩ් බදුරුදීන් බීබීසී ප්‍රවෘත්ති සේවයට කියා සිටියේ, පුද්ගලයන් 5,700ක් කඳවුරුවලින් පිටත්ව ඇති බවත් තවත් 36,000ක් එලඹෙන සති කිහිපය තුල වවුනියා, මුලතිව්. කිලිනොච්චි හා මන්නාරම දිස්ත්‍රික්කවල යලි පදිංචි කෙරෙන බවත්ය.

පසුගිය සති අන්තයේ සන්ඩේ ටයිම්ස් පත්‍රය මෙසේ පැහැදිලි කලේය: "අභ්‍යන්තරව අවතැන් වූ ජනයා ඔවුන්ගේ නිවාසවලට යැවූ බව ආන්ඩුව කියාපායි. නමුත් වාර්තා කියා සිටින්නේ ඔවුන් සිය නිවාස කරා නොගිය බවයි. ඔවුන්ගෙන් සමහරෙක් යලි කඳවුරුවලට ගෙන ආ අතර අනෙක් අය පාසල්වල හා රජයේ සෙසු ගොඩනැගිලිවල පිහිටුවා ඇති අතරමැදි කඳවුරුවලට හෝ තාවකාලික වාසස්ථානවලට යවන ලද බවට ප්‍රශ්න පැන නැග ඇත."

උත්සවය පැවති මන්නාරමේ බටහිර මාන්තායහි දී, 1,200ක් පමන රැඳවියන් මනික් ෆාම් සිට යලි පදිංචි කිරීම පිනිස ගෙනවිත් තිබුනි. මාධ්‍යවේදීන්ට රැඳවුම් කඳවුරුවලට ප්‍රවිෂ්ට වීම තහනම් කෙරුනු නමුදු මෙම මාධ්‍ය අවස්ථාවට සහභාගි වීමට ඔවුහු දිරිගන්වන ලදි. අභ්‍යන්තරව අවතැන් වූවන් කැමරා ඉදිරියේ පෙල ගස්වන ලද අතර ඔවුන් සිය නිවාස කරා ආපසු ගෙන යන බවට වාර්තාකරුවන්ට පවසන ලදි.

කෙසේ වෙතත්, සන්ඩේ ටයිම්ස් සටහන් කරගත් පරිදි, "පිටත නවතා තිබූ බස් රථවලට නගින ලෙස" මිනිසුන්ගෙන් "ඉල්ලා සිටි නමුත්, කෙටි ධාවනයකින් පසුව, ඔවුන් උත්සවය පැවති පලමු ස්ථානය කරා යලි ගෙන එන ලදි, එය වඩාත්ම මාධ්‍යවේදීන්ට ඡායාරූප ගැනීම සඳහා සංවිධානය කෙරුනු අවස්ථාවක් විය."

ලිපිය මෙසේ ද වාර්තා කලේය: "කලින් නිදහස් කෙරුනු සෙසු කන්ඩායම් ද සිය නිවාස කරා ලඟා වී නැත. නිදහස් කෙරුනු, මුලිතිව්හි යලි පදිංචි කිරීමට නියමිතව සිටි, අභ්‍යන්තරව අවතැන් වූ කන්ඩායමක් . . . ඒ වෙනුවට තුනුක්කායිහි පාසල්වල හා රජයේ ගොඩනැගිලිවල පිහිටි අතරමැදි කඳවුරුවලට ගෙන යන ලදි." ඔවුන්ගේ නිවාස දරුනු ලෙස අලාභහානිවලට ලක්ව හෝ විනාශ වී ඇති බව කියමින් ආන්ඩුවේ නිලධාරීන් මෙම පියවර යුක්තියුක්ත කිරීමට උත්සාහ දරා ඇත.

රැඳවියන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටින වැඩෙන පීඩනයකට ආන්ඩුව ලක්ව තිබේ. මීට දෙසතියකට ඉහත දී, සරනගතයන් 50,000ක් දින 15ක් තුල නිදහස් කරන බව දකුනු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයෙන් පැමිනි පාර්ලිමේන්තු නියෝජිත පිරිසකට පවසන ලදි. බටහිර මාන්තායිහි රග දැක්වූ මහජන සබඳතා ප්‍රෝඩාව ආන්ඩුව සිය පොරොන්දුව ඉටු කරන බවට හැඟීමක් ඇති කිරීම පිනිස සැලසුම් කෙරුනක් බවට සැකයක් නැත. මැයි මාසයේ දී ආන්ඩුව කියා සිටියේ මාස හයක් ඇතුලත සියලු සරනගතයන් යලි පදිංචි කරන බවයි.

රැඳවියන් කුඩා අතරමැදි කඳවුරුවලට හා රැඳවුම් මධ්‍යස්ථානවලට මාරු කිරීම තවත් අරමුනක් වෙනුවෙන් ද සේවය කරයි. දරුනු කොන්දේසි පවතින දැවැන්ත මනික් ෆාම් මධ්‍යස්ථානයේ රැඳවියන් අතර වෛරය හා සතුරු භාවය වැඩෙමින් පවතී. එහි ආහාර, වාසස්ථාන, ජල සැපයුම හා වෛද්‍ය සේවා සියල්ල ප්‍රමානවත් නැත. අඩු ගනනේ දෙවරක් එහි හටගත් විරෝධතා, කඳවුරු මුර කරන සොල්දාදුවන් විසින් ප්‍රචන්ඩ ලෙස මර්දනය කරනු ලැබ ඇත. රැඳවියන් කන්ඩායමක් කුඩා මධ්‍යස්ථානවලට විසුරුවා හැරීම මගින් විශාල පරිමානයේ කැරැල්ලක් වලක්වා ගැනීමට ආන්ඩුව හා මිලිටරිය උත්සාහ කරන බවට සැක නැත.

මෙම මහා පරිමාන රඳවාගැනීමේ සැබෑ අරමුන දිවයිනේ දෙමල සුලුතරය බියගැන්වීමයි. 10,000 සිට 12,000ක් අතර තරුනතරුනියන් සංඛ්‍යාවක් "එල්ටීටීඊ සැකකරුවන්" ලෙස මෙම රැඳවුම් කඳවුරුවලින් අල්ලා ගනු ලැබ රහස් මධ්‍යස්ථානවලට මාරු කර ඇතැයි තක්සේරු කෙරෙයි. මෙම රැඳවියන්ට "සිය පවුලේ සාමාජිකයන් හෝ නීතිවේදීන් වෙත මොන යම් හෝ ප්‍රවිෂ්ටයක් නැති" බවත් ඔවුන් "උසාවියකට ඉදිරිපත් කර නැති" බවත් ඇමනෙස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය වාර්තා කර තිබේ.

සිකුරාදා රජය සතු ඩේලි නිව්ස් පුවත්පතට බැසිල් රාජපක්ෂ පැවසුවේ, "දැන් 100,000කට ආසන්න නැතිනම් මුලු සංඛ්‍යාවෙන් අඩකට ආසන්න ප්‍රමානයක් යලි පදිංචි කර ඇති" බවයි. කෙසේ වෙතත්, මහලු ජනයා හා ලමුන් සමහරෙක් හැරුනු කොට, ආන්ඩුව නිදහස් කර ඇත්තේ රැඳවියන් 10,000ක් පමනි. සැප්තැම්බර් මාසයේ කෙරුනු එම "නිදහස් කිරීම" ද එක්සත් ජාතීන්ගේ නිලධාරි එවන් ලින් පැස්කෝ වවුනියාවට කල සංචාරය සමග සම්පාත වූ මහජන සබදතා අභ්‍යාසයක් විය. අඩු ගනනේ ඔවුන්ගෙන් අඩක් සිය ගම්බිම් පැවති දිස්ත්‍රික්කවල රැඳවුම් කඳවුරු කරා යවන ලදි.

යලි පදිංචි කිරීම කල හැක්කේ එම ප්‍රදේශවල බිම් බෝම්බ ඉවත් කොට අදාල පහසුකම් ගොඩනැගුවාට පසුව බව ආන්ඩුව කියාපායි. එහෙත් යුද්ධය අවසන් වී මාස හයකට ආසන්න කලක් ගතවී ඇතත්, යලි ඉදිකිරීම් යොමු වී ඇත්තේ 26 වසරක යුද්ධයෙන් විනාශයට පත්ව ඇති නිවාස, පාසල් හා රෝහල් ගොඩනැගීමට නොව, මෙම ප්‍රදේශවල නිත්‍ය මිලිටරි වාඩිලෑමක් සූදානම් කිරීම වෙතය.

යුද්ධයේ අවසන් වසර තුල දී, මිලිටරිය, දිවයිනේ වයඹ දිග වෙරලේ මන්නාරමේ සිට නැගෙනහිර වෙරලේ මුලිතිව් දක්වා විහිදුනු, එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශයෙන් දැවැන්ත පදාසයක් අල්ලා ගත්තේය. මෙම ප්‍රදේශවල ජනගහනයෙන් දැවැන්ත කොටසක් එක්කො රැඳවුම් කඳවුරු තුල ය නැතහොත් පලා ගොස් ඇත. මෙම ප්‍රදේශවල නව මිලිටරි කඳවුරු හා පොලිස් ස්ථාන ඉදිකෙරෙමින් පවතී. හමුදාව උතුරේ හා නැගෙනහිර සිය පාලනය ශක්තිමත් කරනු වස් තවත් භටයන් 50,000ක් බඳවා ගැනීමට යයි.

ආරක්ෂක හමුදා මූලස්ථාන පහක් -- ඉන් දෙකක් එල්ටීටීඊයේ බල මධ්‍යස්ථාන ලෙස පැවති කිලිනොච්චියේ හා මුලතිව්වල -- පිහිටුවනු ලැබ තිබේ. දිවයිනේ උතුරේ හා නැගෙනහිර මුහුදු ප්‍රදේශවල මුර සංචාරය කරනු පිනිස නව වෙරලාරක්ෂක පද්ධතියක් ගොඩනැගීමට මිලිටරිය සැලසුම් කරයි. දෙමල ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී සුරේෂ් ප්‍රේමචන්ද්‍රන්ට අනුව, කිලිනොච්චියේ අක්කර 150ක භූමි ප්‍රදේශයක දැවැන්ත හමුදා කඳවුරක් ගොඩනගමින් පවතී.

ආන්ඩුව දැනටමත් නැගෙනහිර නව පොලිස් ස්ථාන 37ක් ද උතුරේ නව පොලිස් ස්ථාන 8ක් ද පිහිටුවා ඇත. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ තවත් පොලිස් ස්ථාන හතරක් පිහිටුවීමට නියමිතය. මුලිතිව්හි පොලිස් අභ්‍යාස විද්‍යාලයක් පිහිටුවනු ඇත.

කොලඹ දිවයිනේ උතුරු කොනේ යාපනයට සම්බන්ධ කරන ප්‍රධාන ඒ-9 මහා මාර්ගය සීමිත මගී බස් සේවාවක් සඳහා විවෘත කර තිබේ. බස් රථ ධාවනය වන්නේ මිලිටරි රැකවල් සමගය. කලින් එල්ටීටීඊය යටතේ පැවති භූමි ප්‍රදේශය තුල කිසිදු ස්ථානයක සිවිල් ජනයා වාසය කරන බවට මොන යම් හෝ ලකුනක් නැති බව මෑත දී එම බස් රථයක ගමන් කල යාපනයේ වැසියෙක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පැවසීය. යාපන අර්ධද්වීපයේ මීසාලෙයි සිට වවුනියාව අසල ඕමන්තෙයි දක්වා වූ, කිලෝමීටර් 110ක් පමන වන මාර්ගයේ, සෑම මීටර් 100කට ම සොල්දාදුවන් දෙදෙනා බැගින් යොදවා ඇති අතර සෑම මීටර් 500කට ම කුඩා මිලිටරි මුරපොලක් පිහිටුවා ඇත. එම අතරමගදී මගීන්ට බසයෙන් බැසීමට අවසර නැත.

කලින් එල්ටීටීඊය යටතේ පැවති භූමි ප්‍රදේශ ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කිරීමට රාජපක්ෂ ආන්ඩුව සැලසුම් කරයි. 2007 දී "මුදාගත්" නැගෙනහිර පලාත තුල එම ක්‍රියාදාමය දැනටමත් ආරම්භ කර තිබේ. ත්‍රිකුනාමලය අසල විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවා ඇති අතර තවත් කලාප දෙකක් මඩකලපුවේ හා අම්පාරේ පිහිටුවීටම සැලසුම් කර ඇත. උතුරේ කිලිනොච්චියේ හා මුලතිව්වල විශේෂ ආර්ථික කලාප සඳහා ප්‍රදේශ වෙන්කරගෙන තිබේ.

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප), සියලු දෙමල රැඳවියන් වහාම නිදහස් කරනු, කඳවුරු ඉවත් කරනු, සිය ජීවිත යලි ගොඩනගා ගැනීම පිනිස සරනගතයන්ට ආධාර සපයනු, සහ උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු ආරක්ෂක හමුදා වහාම ඉවත් කරනු යනුවෙන් ඉල්ලා සිටින උද්ඝෝෂනයක් දියත් කර ඇත.

ශ්‍රී ලංකා ආන්ඩුව හෙලා දකිමින් ද සියලු දෙමල රැඳවියන් වහාම හා කොන්දේසි විරහිතව නිදහස් කරන ලෙස ඉල්ලමින් ද ලිපි යැවීම, රැස්වීම් සංවිධානය කිරීම හා විරෝධතා සංවිධානය කිරීම මගින්, අපගේ උද්ඝෝෂනයට සහයෝගය දෙන ලෙස, කම්කරුවන්ගෙන්, තරුනයන්ගෙන් හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම ගැන උත්සුක සියලු දෙනාගෙන් ම සසප ඉල්ලා සිටී.

ලිපි යැවිය යුත්තේ:

ගෝඨාභය රාජපක්ෂ,
ආරක්ෂක, මහජන ආරක්ෂක, නීතිය හා සාමය පිලිබඳ ලේකම්,
ආරක්ෂක අමාත්‍යංශය,
කොලඹ,
ශ්‍රී ලංකාව.
ඊ-මේල්: gotabaya@defence.lk

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්,
පැරනි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල,
කොලඹ,
ශ්‍රී ලංකාව.

ඔබ යවන ලිපිවල පිටපත් අප වෙත එවන්න.

සමාජවාදී සමානතා පක්ෂය,
301 1/1,
ප්‍රධාන පාර,
අත්තිඩිය,
දෙහිවල.
ශ්‍රී ලංකාව.
දුරකතන/ෆැක්ස්: 0094 11 2712104

ලෝක සමාජවාදී වෙබ් අඩවිය,
ඊ-මේල්: editor@wsws.org